# විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
## (බාහිර) - 2008

## මානවශාස්ත්‍ර පීඨය

## නාට්‍ය හා රංග කලාව - DMAT -E1025

## ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංග කලාව

**ප්‍රශ්න පහකට (05)පමණක් පිළිතුරු සපයන්න**

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි

කාලය : පැය 03 යි

---

01. අතීත ලංකාවේ දියුණු නාට්‍ය සම්ප්‍රදායක් නොපැවතීමට බලපෑ හේතු සාධක කවරේදැයි විස්තර කරන්න.

02. නාට්‍යමය ලක්ෂණ අන්තර්ගත බෞද්ධ වත් පිළිවෙත් පිළිබඳ විග්‍රහ කරන්න.

03. දේශීය යාතුකර්මවල දක්නට ලැබෙන අන්තර් රංග අවස්ථා (Dramatic interludes) <u>දෙකක්</u> පිළිබඳ විස්තර කරන්න.

04. දේශීය ගැමි නාටක අතර කෝලම් නාට්‍ය සම්ප්‍රදායේ ඔබ දකින විශේෂතා පිළිබඳ විවරණයක් කරන්න.

05. නාඩගම් සම්ප්‍රදායේ පරිහානිය කෙරෙහි තූර්ති නාටකයේ බලපෑම කෙබඳු දැයි සාකච්ඡා කරන්න.

06. "සමකාලීන සමාජය හා එහි පවුල් සංස්ථාව පිළිබඳ නාට්‍යමය විග්‍රහයක් සොකරි නාටකයේ අන්තර්ගත වේ. " විමසන්න.

07. සමකාලීන සිංහල නාට්‍යකලාවේ දියුණුවට තුඩුදුන් හේතු සාධක විමර්ශනය කරන්න.

08. ලංකා විශ්වවිද්‍යාලයේ නිෂ්පාදිත නාට්‍ය අතරින් 'කපුවා කපෝති' සාර්ථක නිර්මාණයක් ලෙස විචාරකයන් විසින් හඳුන්වන්නේ කවර හේතු පදනම් කරගෙනද?

09. සිංහල නාට්‍ය කලාව එතෙක් ගමන් කරමින් තිබූ සම්ප්‍රදායික මාර්ගයෙන් මුදවා ගැනීමෙහි ලා <u>සුගතපාල ද සිල්වා</u> ගේ මැදිහත් වීම කෙබඳුදැයි විමසන්න.

10. මතු දැක්වෙන නාට්‍යකරුවන් අතරින් <u>එක්</u> අයකු තෝරාගෙන ඔහුගේ කෘතීන් පිළිබඳ ඇගයීමක් කරන්න.

    I. එදිරිවීර සරච්චන්ද්‍ර
    II. දයානන්ද ගුණවර්ධන
    III. ගුණසේන ගලප්පත්ති
    IV. හෙන්රි ජයසේන

*************************